# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1797/16 – 2013 පෙබරවාරි 13 වැනි බදාදා – 2013.02.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවාපත්තුව සුළු කොට්ඨාසයේ ගලගම (අ.ග.පි. 301) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එච්/බීඑල්ජ්/2007/584 හා 2007 දෙසැම්බර් 15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 22.418ක් පමණ වන දොළහේන වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

උතුරට: අ.ග.පි. 308 අම්බලගම; නැගෙනහිරට: කැබලි අංක 311, 204, 202ඒ සහ ඔය; දකුණට: ඔය සහ කැබලි අංක 511; බටහිරට: කැබලි අංක 333, 332, 331, 324, 323, 322, 320, 211බී, 211ඒ, 212, 210 සහ 208ඒ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/වීර්/186.
2013 ජනවාරි මස 08 වැනි දින,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 112

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර මහ නගරසභා සීමාව තුළ සුළු කොට්ඨාසයේ නූපේ, කඩේවීදිය, කොට්ඨාස අංක 6, 7 සහ 8 ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/එම්ටීආර්/2012/33 හා 2012 අගෝස්තු 30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර ' ඒ' – මන්නැහෙගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0002**
උතුරට: එස්. එෆ්. වසීනා හිමිකම් කියන මන්නැහෙගෙවත්ත; නැගෙනහිරට: එම්. ඒ. එම්. කසාලි හිමිකම් කියන මන්නැහෙගෙවත්ත සහ කැබලි අක්ෂර බී; දකුණට සහ බටහිරට: මාර්ග (මා.සං.අ.).

02. **කැබලි අක්ෂර ' බී' – මන්නැහෙගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0001**
උතුරට: එම්. ඒ. එම්. කසාලි හිමිකම් කියන මන්නැහෙගෙවත්ත; නැගෙනහිරට සහ දකුණට: මාර්ග (මා.සං.අ.); බටහිරට: කැබලි අක්ෂර ඒ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංක: 4/3/6/2012/එච්ඩබ්/01.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංක: MTR/LND/ACQUI/LI/3930.
2013 පෙබරවාරි මස 12 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', අංක 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

03 – 142



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.*